*සැ.යු.*: මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI වන කොටසේ 2025 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,448 - 2025 අගෝස්තු මස 01 වැනි සිකුරාදා - 2025.08.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශය ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... ... ... | |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... ... | 756 |
| මිල පාලන දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... ... | 757 |
| නැවියන්ට දැන්වීම් ... ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු මස 22 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 අගෝස්තු මස 07 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජූනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# රජයේ නිවේදන

## ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - වැලිමඩ

### 2025 යල කන්න රැස්වීමේ තීරණ දැනුම් දීම - දඹවින්න ව්‍යාපාරය

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹවින්න ව්‍යාපාරයේ 2025 යල කන්නය සඳහා කන්න රැස්වීම **2025.07.15** වැනි දින **ප.ව. 1.00**ට දඹවින්න ප්‍රජා ශාලාවේ දී පවත්වන ලද අතර එහි දී පහත තීරණ ගන්නා ලදී :

| | | |
|---|---|---|
| 1. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා අදාළ ගොවි සංවිධාන විසින් නඩත්තු වැඩ අවසන් කිරීමට යෝජිත දිනය | - 2025.07.12 |
| 2. | වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය | - අක්කර 250 |
| 3. | වගා කිරීමට යෝජිත බෝග හෝ බෝග වර්ගය | - උඩරට එළවළු |
| 4. | ඇල වේලි ශුද්ධ කිරීමේ හා රොන්මඩ ඉවත් කිරීමේ අවසාන දිනය | - 2025.07.12 |
| 5. | ජලය නිකුත් කිරීමට යෝජිත ආරම්භක දිනය | - 2025.07.16 |
| 6. | බිම් සකස් කිරීම හා පැළ සිටුවීමට යෝජිත අවසාන දිනය | - 2025.07.30 |
| 7. | මුර ජලය නිකුත් කිරීම සඳහා යෝජිත ආරම්භක දිනය | - අවශ්‍ය පරිදි |
| 8. | ජලය නිකුත් කිරීමට යෝජිත අවසාන දිනය | - 2025.11.30 |
| 8. | ඇල වේලි ශුද්ධ නොකිරීම සඳහා වූ දඩය (වී පැලක් සඳහා) | - රු. 2,000.00 |

1994 අංක 13 දරන වාරිමාර්ග (සංශෝධිත) වාරිමාර්ග ආඥාපනතේ 11 වැනි වගන්තිය 1 හා 2 උපවගන්ති යටතේ කන්නයට අදාළව සකස් කර ගන්නා ලද නීති රීති,

**ඇළවේලි සුද්ද නොකරන අයට දඩ මුදල් නියම කිරීම :**

තමාට අයත් ඇළ කොටස සුද්ධ නොකළහොත් අදාළ දඩ මුදල අයකරගෙන ගොවි සංවිධානයේ ගිණුමට බැර කළ යුතු අතර, එම මුදල යොදා ඇළවේලි සුද්ධ කිරීම ගොවි සංවිධාන විසින් සිදු කළ යුතුය. එසේ නොකරන්නේ නම් ව්‍යාපාර කමිටු තීරණ අනුව ජලය ලබාදීම අත්හිටුවනු ලැබේ.

**අනවසර ජල පරිභෝජනය :**

(I) මෙවලම් යොදා ගැනීම

අනවසර ලෙස මෙවලම් යොදාගෙන ජලය පරිභෝජනය කළහොත් එම මෙවලම් රජයේ භාණ්ඩ බවට පත් කරනු ලැබේ.

(II) ජල හැරවුම් නිර්මිතවලට හානි සිදුකිරීම :

වාරිමාර්ග දෙපාර්තමේන්තුව තක්සේරුවට අනුව එම මුදල අදාළ පුද්ගලයින්ගෙන් අයකරගෙන ගොවි සංවිධානයේ මැදිහත්වීම මත එම මුදලින් නිර්මිතය අලුත්වැඩියා කළයුතු වේ. එසේ නොවන්නේ නම් ජලය ලබා දීම අත්හිටවනු ලැබේ.

**කන්න රැස්වීම් තීන්දු වෙනස් කිරීම :**

කන්න රැස්වීම් තීන්දු තීරණ වෙනස් කිරීම තවත් නීත්‍යානුකූල වූ රැස්වීමක දී පමණක් සිදු කරනු ලැබේ.

වී. පී. සුනෙත් ජිනේන්ද්‍රසේන,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2025 ජූලි මස 10 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-07

**ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - හඟුරන්කෙත**

සියළු දෙනාගේ දැන ගැනීම පිණිසයි

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් 175 වන අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ (2) වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝගයන්ට අනුව 2008 අගෝස්තු මස 15 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රය* මගින් හඟුරන්කෙත ශ්‍රී මහා විෂ්ණු දේවාල පෙරහැර *ගැසට්* කරන ලද පෙරහැරක් වශයෙන් ප්‍රකාශයට පත්කර ඇත.

එකී නියෝග ප්‍රකාරව 2025 වර්ෂයට අදාළව හඟුරන්කෙත ඓතිහාසික ශ්‍රී මහා විෂ්ණු දේවාල ඇසළ මහා පෙරහැර 2025 අගෝස්තු මස 23 වැනි දින සිට 2025 සැප්තැම්බර් මස 08 වැනි දින දක්වා පැවැත්වෙන බව සියළු දෙනාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

වයි. එම්. ඒ. මිහිරාන් බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
හඟුරන්කෙත.

08-16

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**යූනියන් බැන්ක් ඔෆ් කළඹ පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ යූනියන් බැන්ක් ඔෆ් කළඹ පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කළඹ පීඑල්සී (මෙහි මින්මතු "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වන,) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව, 2025 ජූලි මස 07 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, කටුනායක, අපනයන සැකසුම් කලාපයේ, 1 වන රින්ග් පාරේ පිහිටි සමාගම් ලියාපදිංචි අංක PV 14930 දරන, ෂෝ වූ ෂෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (මෙහි මින්මතු ඇතැම් තැනක "බන්ධනදායී" වශයෙන් හඳුන්වන,) විසින් කොළඹ 03, ගාලු පාර, අංක 64 දරන ස්ථානයෙහි පිහිටි, සමාගම් ලියාපදිංචි අංක PB676PQ දරන, යූනියන් බැන්ක් ඔෆ් කළඹ පීඑල්සී (මෙහි මින්මතු "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වන,) වෙතින් ප්‍රතිව්‍යුහගත කරන ලද කාලීන ණය පහසුකම ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායී විසින් සහ කොළඹ 13, පිකරින් පාරේ, අංක 144/3 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන, සමාගම් ලියාපදිංචි අංක PV774 දරන, එක්ස්පෝ ප්‍රොපර්ටි ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (මෙහි මින්මතු ඇතැම් තැනක "උකස්කරු" වශයෙන් හඳුන්වන,) විසින් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 770,000/-ක මුදලක් සඳහා ප්‍රසිද්ධ නොතාරිස් එල්. ජී. එන්. සාරංගි යන අය සහතික කරන ලද අංක 740 සහ 2018.06.01 දින දරන පවත්නා ප්‍රාථමිකවල උකස් බැඳුම්කරය සහ එම නොතාරිස් සහතික කරන ලද අංක 1423 සහ 2024.11.04 දින දරන අතිරේක ඇපසුරැකුම්වල උකස් බැඳුම්කරය සහ ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 225,000/-ක මුදලක් සඳහා ප්‍රසිද්ධ නොතාරිස් අයි. කරුණානායක යන අය සහතික කරන ලද අංක 1276 සහ 2019.10.11 දින දරන පවත්නා උකස් බැඳුම්කරය, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 150,000/-ක මුදලක් සඳහා එම නොතාරිස් සහතික කරන ලද අංක 763 දරන පවත්නා ප්‍රාථමික උකස් බැඳුම්කරය, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 49,000/-ක මුදලක් සඳහා එම නොතාරිස් සහතික කරන ලද අංක 1278 සහ 2019.10.11 දින දරන අතිරේක උකස් බැඳුම්කරය, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 33,450,000/-ක මුදලක් සඳහා එම නොතාරිස් සහතික කරන ලද අංක 764 දරන පවත්නා ප්‍රාථමික වල උකස් බැඳුම්කරය සහ ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 81,000/-ක මුදලක් සඳහා එම නොතාරිස් සහතික කරන ලද අංක 1277 දරන අතිරේක උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට/ඉදිරිපත් කර, ඉහත කී ණය පහසුකම් නිසා යූනියන් බැංකුව වෙත අයවිය යුතු ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දහනවලක්ෂ අනූපන්දහස් තුන්සිය විසි නවයකුත් ශත හතරක (ඇ.ඩො. 1,995,329.04) මුදල සහ ඒ මත පොළිය ආපසු ගෙවා පියවා දැමීම පිණිස, මෙහි පහත පළමුවන, දෙවන, තුන්වන සහ හතරවන උපලේඛනවල සවිස්තරව දැක්වෙන දේපළ, පොදු ඇපයක් වශයෙන් උකස්කොට ඇපයට තබා ඇති බැවින් ද,

එබැවින්, ඉහත සඳහන් ණය පහසුකම/ පහසුකම් නිසා, 2025.04.09 වැනි දිනට මුළු හිඟ මුදල වන ඇමෙරිකානු එක්සත්

ජනපද ඩොලර් දහනවලක්ෂ අනූපන්දහස් තුන්සිය විසිනවයකුත් ශත හතරක (ඇ.ඩො. 1,995,329.04) මුදල සහ තව ද, ඊට අමතරව ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දහනවලක්ෂ හතළිස් නවදහස් අටසිය හැත්තෑ හතරකුත් ශත අනූපහක (ඇ.ඩො. 1,949,874.95) මුල් හිඟ මුදල මත 2025.04.10 වැනි දින සිට එකී දේපළ විකිණීමේ දිනය තෙක් වර්ෂයකට, මාස 3 ක SOFR+4%+2% බැගින් පොළිය, ඉහත කී බන්ධනදායිගෙන්/ උකස්කරුගෙන් යූනියන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තව ද, යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023.12.05 දිනැති යෝජනා සම්මතයක් සම්මත කර ඇති අතර, එකී යෝජනා සම්මතය මෙයින් ඉල්ලා අස්කරගන්නා බැවින් ද,

එකී බන්ධනදායි සහ උකස්කරු විසින් ඉහත ණය ශේෂයන් හෝ ඉන් යම් කොටසක් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදුකර ඇති බවට යූනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලය ප්‍රකාරව ක්‍රියාකරමින්, 2025.04.09 වැනි දිනට මුළු හිඟ මුදල වන ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දහනවලක්ෂ අනූපන්දහස් තුන්සිය විසි නවයකුත් ශත හතරක (ඇ.ඩො. 1,995,329.04) මුදල සහ 2025.04.10 වැනි දින සිට ඉහත සඳහන් කළ පරිදි පොළිය සහ තව ද, ඉහත කී අංක 740, 763, 764, 1276, 1277, 1278 සහ 1423 දරන උකස් බැඳුම්කර ප්‍රකාරව සහ 1990 අංක 4 දරන එකී පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගැනීමට යූනියන් බැංකුව වෙත හිමිකම් ඇති වෙනත් සියළුම මුදල් ප්‍රමාණයන් ද, අයකර ගැනීම සඳහා, ප්‍රසිද්ධ නොතාරිස් එල්. ජී. එන්. සාරංගි යන අය සහතික කරන ලද අංක 740 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ එම නොතාරිස් සහතික කරන ලද අංක 1423 දරන අතිරේක උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් අයි. කරුණානායක යන අය සහතික කරන ලද අංක 763, 764, 1276, 1277 සහ 1278 උකස් බැඳුම්කර ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුවට උකසට තබන ලද මෙහි පහත පළමුවන, දෙවන, තුන්වන සහ හතරවන උපලේඛනවල සවිස්තරව දැක්වෙන එකී දේපළ, 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් දේපළ වෙන්දේසිකරුවන් වන වන්දිමා පී. ගමගේ ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Con SD 07/04, Con SD 07/06, 20 යටතේ ලියාපදිංචි කරන ලදුව, වර්තමානයේ දී Con SD 07/03, 05, 19 දරන වෙළුම/පත්ඉරුව වෙත ඉදිරියට ගෙන ගොස් ඇත.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සහා සීමාව තුළ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජිංතුපිටිය ග්‍රාම නිලධාරි වසමේ, අංක 10 දරන නාගරික කොට්ඨාසයේ ජිනිතුපිටිය කොටහේන නව හෙට්ටි වීදියේ පිහිටි, බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් මැන සාදන ලද අංක 4203 සහ 2017 මැයි මස 12 දින දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත, කොළඹ 12, අලුත් චෙට්ටි විදියේ, වරිපනම් අංක 132 දරන, බිම් මහලේ අංක CPF0P1 දරන සහාධිපත්‍ය කොටස වන කාර්යාල ඉඩකඩක් වේ.

ඉහත කී CPF0P1 දරන කාර්යාල ඉඩකඩට මායිම් මෙහි පහත සඳහන් පරිදි වේ. එනම් :-

*උතුරට* : නව චෙට්ටි වීදියේ වරිපනම් අංක 140, 140/10 සහ 140/11 දරන පරිශ්‍රයන් වෙන්කරන මෙම සහාධිපත්‍ය කොටසේ බිත්තියේ මධ්‍ය, මෙම සහාධිපත්‍ය කොටස සහ CE9 (SW), CE10 (සෝපානය), CE2, CE3, CE11 (SW), CE12 (සෝපානය) & CE4 අතර බිත්තියේ මධ්‍ය ද;

*නැගෙනහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE5, CE13, CE14, CE16 සහ CE15 අතර බිත්තියේ මධ්‍ය ද;

*දකුණට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE14, CE6, CE7, CE8 අතර බිත්තියේ මධ්‍ය සහ නව හෙට්ටි වීදියේ වරිපනම් අංක 128 දරන පරිශ්‍රය වෙන්කරන මෙම සහාධිපත්‍ය කොටසේ බිත්තියේ මධ්‍ය ද;

*බස්නාහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE17 සහ CE18 අතර බිත්තියේ මධ්‍ය ද;

*පහළට* : එහිම බිම් මහළ ද;

*ඉහළට* : ඉහළින් CPF1P1 හි කොන්ක්‍රීට් ගෙබිමේ මධ්‍ය ද;

යන මෙකී මායිම් තුළ පිහිටි වර්ග මීටර් පන්සිය තිස්නවයයි දශම හතයි හතක් (ව.මී. 539.77) *නොහොත්* වර්ග අඩි පන්දහස් අටසිය දහයක් (ව.අ. 5,810) විශාල ගෙබිම ය.
ආසන්නතම පොදු ප්‍රදේශය CE17 වේ.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සහා සීමාව තුළ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජිංතුපිටිය ග්‍රාම නිලධාරි වසමේ, අංක 10 දරන නාගරික කොට්ඨාසයේ ජිනිතුපිටිය කොටහේන නව හෙට්ටි වීදියේ පිහිටි, බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් මැන සාදන ලද අංක 4203 සහ 2017 මැයි මස 12 දින දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත, කොළඹ 12, අලුත් චෙට්ටි වීදියේ, වරිපනම් අංක 132 M/1 දරන, මෙසනිල් මහලේ අංක CPFMP1 දරන සහාධිපත්‍ය කොටස වන සාප්පුවක් වේ.

ඉහත කී CPF0P1 දරන සාප්පුවට මායිම් මෙහි පහත සඳහන් පරිදි වේ. එනම් :-

*උතුරට* : නව චෙට්ටි වීදියේ වරිපනම් අංක 140, 140/10 සහ 140/11 දරන පරිශ්‍රයන් වෙන්කරන මෙම සහාධිපත්‍ය කොටසේ බිත්තියේ මධ්‍ය ද;

*නැගෙනහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CPFMP2 අතර බිත්තියේ මධ්‍ය ද;

*දකුණට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE25 අතර බිත්තියේ මධ්‍ය ද;

*බස්නාහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE9 (SW) අතර බිත්තියේ මධ්‍ය ද;

*පහළට* : එහිම බිම් මහළ ද;

*ඉහළට* : ඉහළින් CPF1P1 සහ CE15 හි කොන්ක්‍රීට් ගෙබිමේ මධ්‍ය ද;

යන මෙකී මායිම් තුළ පිහිටි වර්ගමීටර් දොළහයි දශම පහයි හතරක් (ව.මී. 12.54) *නොහොත්* වර්ග අඩි එකසිය තිස්පහක් (ව.අ. 135) විශාල ගෙබිමය.

පොදු අංගෝපාංග තුළ නොබෙදූ පංගුවේ වටිනාකම 0.031%ක් වේ.

ආසන්නතම පොදු ප්‍රදේශය CE25 වේ.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමාව තුළ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජිංතුපිටිය ග්‍රාම නිලධාරි වසමේ, අංක 10 දරන නාගරික කොට්ඨාසයේ ජිනිතුපිටිය කොටහේන නව හෙට්ටි වීදියේ පිහිටි, බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් මැන සාදන ලද අංක 4203 සහ 2017 මැයි මස 12 දින දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත, කොළඹ 12, අලුත් චෙට්ටි වීදියේ, වරිපනම් අංක 132 M/8 දරන, මෙසනින් මහලේ අංක CPFMP8 දරන සහාධිපත්‍ය කොටස වන සාප්පුවක් වේ.

ඉහත කී CPFMP8 දරන සාප්පුවට මායිම් මෙහි පහත සඳහන් පරිදි වේ. එනම් :-

*උතුරට* : නව චෙට්ටි වීදියේ වරිපනම් අංක 140, 140/10 සහ 140/11 දරන පරිශ්‍රයන් වෙන් කරන මෙම සහාධිපත්‍ය කොටසේ බිත්තියේ මධ්‍ය ද;

*නැගෙනහිරට* : මෙම සහාධිපත්‍ය කොටසේ බිත්තියේ මධ්‍ය සහ CE9 (SW) සහ CE 25 ද;

*දකුණට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE24 අතර බිත්තියේ මධ්‍ය ද;

*බස්නාහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CPFMP7 සහ CE22 අතර බිත්තියේ මධ්‍ය ද;

*පහළට* : එහිම බිම් මහළ ද;

*ඉහළට* : ඉහළින් CPF1P10 හි කොන්ක්‍රීට් ගෙබිමේ මධ්‍ය ද;

යන මෙකී මායිම් තුළ පිහිටි වර්ගමීටර් දොළහයි දශම හයයි තුනක් (ව.මී. 12.63) *නොහොත්* වර්ග අඩි එකසිය තිස්හයක් (ව.අ. 136) විශාල ගෙබිමය.

පොදු අංගෝපාංග තුළ නොබෙදූ පංගුවේ වටිනාකම 0.031%ක් වේ.

ආසන්නතම පොදු ප්‍රදේශය CE24 වේ.

**සහ පොදු අංගෝපාංග ද සමඟ ය.**

**දෙවන උපලේඛනය (උකස් බැඳුම්කර අංක 763 සහ 1278)**

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Con D 06/92 සහ Con D 6/112 යටතේ ලියාපදිංචි කර ඇත.

අංක FOP1 දරන සහාධිපත්‍ය කොටස,

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව තුළ බටහිර කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 24 දරන නාගරික කොට්ඨාසයේ, සුදුවැල්ල ග්‍රාම නිලධාරි වසමේ, අංක 24 දරන නාගරික කොට්ඨාසයේ පිහිටි, පාර්ක් වීදියේ, වරිපනම් අංක 68 දරන, බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් මැන සාදන ලද අංක 2218 සහ 2007 මැයි මස 04 දින දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත අංක F0P1 දරන සහාධිපත්‍ය කොටසට මායිම් මෙහි පහත සඳහන් පරිදි වේ. එනම් :

*උතුරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE17 සහ CE11 අතර බිත්තියේ මධ්‍ය ද;

*නැගෙනහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE11 සහ CE19 අතර බිත්තියේ මධ්‍ය ද;

*දකුණට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE19, CE20, CE21 සහ CE17 අතර බිත්තියේ මධ්‍ය ද;

*බස්නාහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE19, CE20, CE21 සහ CE17 අතර බිත්තියේ මධ්‍ය ද;

*පහළට* : CE1 ට ඉහළ මෙම සහාධිපත්‍ය කොටසේ කොන්ක්‍රීට් ගෙබිමේ මධ්‍ය ද;

*ඉහළට* : ඉහළින් M1P1 හි කොන්ක්‍රීට් ගෙබිමේ මධ්‍ය ද;

යන මෙකී මායිම් තුළ පිහිටි වර්ගමීටර් අනූහයයි දශම එකයි පහක් (ව.මී. 96.15) *නොහොත්* වර්ග අඩි එක්දහස් තිස්පහක් (ව.අ. 1,035) විශාල ගෙබිමය.

එකී FOP1 සභාධිපත්‍ය කොටස වනාහි වාණිජ ප්‍රදේශයක් වේ.

සභාධිපත්‍ය දේපලේ පොදු අංගෝපාංග තුළ එකී FOP1දරන සභාධිපත්‍ය කොටසේ නොබෙදූ පංගුවේ වටිනාකම 1.686%ක් වේ.

එකී FOP1 දරන සභාධිපත්‍ය කොටසට ආසන්නතම පොදු ප්‍රදේශයෙන් ප්‍රවේශය CE11 වේ.

පිටු අංක 4හි ලොට් 32 වශයෙන් ලකුණු කරන ලද රථගාල් කිරීමේ පහසුකම ද සමඟ ය.

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Con A 173/75 යටතේ ලියාපදිංචිකර ඇත.

**සහ පොදු අංගෝපාංග ද සමග ය.**

තව ද, මෙහි පහත සඳහන් මාර්ග අයිතිය ද සමග ය.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව තුළ, සුදුවැල්ල, අංක 24 දරන නාගරික කොට්ඨාසයේ පිහිටි පාර්ක් වීදියේ, වරිපනම් අංක 66 සහ 66A දරන, බලයලත් මිනින්දෝරු එල්. ටී. මාදොල විසින් මැන සාදන ලද අංක 2003/99 සහ 2003 අප්‍රේල් මස 20 දින දරන පිඹුරේ නිරූපිත වීථි රේඛාවක් වන ලොට් "1B" වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට (බලයලත් මිනින්දෝරු ඒ. එෆ්. සමීර් විසින් මැන සාදන ලද අංක 2305 සහ 1980 මැයි මස 10 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කැබැල්ලේ නැවත මැන බෙදා වෙන්කිරීමක් වන සහ බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් මැන සාදන ලද අංක 819 සහ 2000 ජූලි මස 12 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කැබැල්ලේ නැවත මැන අනුබෙදා වෙන්කිරීමක් වන) මායිම්, උතුරට : ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත ද, නැගෙනහිරට: පාක් වීදිය ද, දකුණට : ලොට් 1A ද, බස්නාහිරට : ලොට් 1A ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2003/99 දරන පිඹුර අනුව පර්චස් බින්දුවයි දශම තුනයි හයක් (පර්. 0.36) විශාල බිම් කොටස. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 956/228 යටතේ ලියාපදිංචි කරන ලදුව වර්තමානයේ දී A 1160/54 වෙත ඉදිරියට ගෙන ගොස් ඇත.

**තෙවන උපලේඛනය (උකස් බැඳුම්කර අංක 764 සහ 1277)**

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Con A 173/77, Con D 07/63 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කරන ලදුව, වර්තමානයේ දී Con D 07/64, Con D 07/129 දරන වෙළුම/පත්ඉරුව වෙත ඉදිරියට ගෙන ගොස් ඇත.

(*අ*) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව තුළ, බටහිර කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 24 දරන නාගරික කොට්ඨාසයේ, සුදුවැල්ල ග්‍රාම නිලධාරි වසමේ, අංක 24 දරන නාගරික කොට්ඨාසයේ පිහිටි කොළඹ 02, පාර්ක් වීදියේ, වරිපනම් අංක 66 M/1 දරන, බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් මැන සාදන ලද අංක 2218 සහ 2007 මැයි මස 04 දින දරන සභාධිපත්‍ය පිඹුරේ නිරූපිත කාර්යාලයක්, වැසිකිළි තුනක් සහ බැල්කනියකින් සමන්විත වන අංක M1P1 දරන සභාධිපත්‍ය කොටසට මායිම් මෙහි පහත සඳහන් පරිදි වේ. එනම් :-

*උතුරට* : මෙම සභාධිපත්‍ය කොටස සහ CE4, CE23, CE20, CE10 සහ CE 11අතර බිත්තියේ මධ්‍ය ද;

*නැගෙනහිරට* : මෙම සභාධිපත්‍ය කොටස සහ CE11 සහ CE22, CE12 සහ ACP-O අතර බිත්තියේ මධ්‍ය ද;

*දකුණට* : මෙම සභාධිපත්‍ය කොටස සහ CE22, CE12, ACP-0 අතර බිත්තියේ මධ්‍ය ද;

*බස්නාහිරට* : මෙම සභාධිපත්‍ය කොටස සහ ACP-0, CE4, CE23, CE20 සහ CE10 අතර බිත්තියේ මධ්‍ය ද;

*පහළට* : CE14, CE15, CPF0P1 සහ CE19 ට ඉහළින් මෙම සභාධිපත්‍ය කොටසේ කොන්ක්‍රීට් ගෙබිමේ මධ්‍ය ද;

*ඉහළට* : F1P2 ට ඉහළින් සහ F1P1 දරන මෙම සභාධිපත්‍ය කොටසේ (පංගුවක) කොන්ක්‍රීට් ගෙබිමේ මධ්‍ය ද;

යන මෙකී මායිම් තුළ පිහිටි වර්ගමීටර් දෙසිය හයයි දශම එකයි පහක් (ව.මී. 206.15) *නොහොත්* වර්ග අඩි දෙදහස් දෙසිය දහනවයක් (ව.අ. 2,219) විශාල ගෙබිම ය.

(*ආ*) ඉහත කී සභාධිපත්‍ය දේපලේ මෙසනින් මහලේ (බැල්කනියේ) ACP-0 දරන අනුබැඳි සභාධිපත්‍ය කොටසට මායිම්,

*උතුරට* : මෙම අනුබැඳි සභාධිපත්‍ය කොටස සහ CPM1P1 අතර බිත්තියේ මධ්‍ය ද;

*නැගෙනහිරට* : මෙම අනුබැඳි සභාධිපත්‍ය කොටස සහ CPM1P1 සහ CE12 අතර බිත්තියේ මධ්‍ය ද;

*දකුණට* : මෙම අනුබැඳි සභාධිපත්‍ය කොටස සහ CE12 අතර බිත්තියේ මධ්‍ය ද;

*බස්නාහිරට* : මෙම අනුබැඳි සභාධිපත්‍ය කොටස සහ CPM1P1 අතර බිත්තියේ මධ්‍ය ද;

*පහළට* : CE12 සහ CE15 ට ඉහළින් මෙම අනුබැඳි සහාධිපත්‍ය කොටසේ කොන්ක්‍රීට් ගෙබිමේ මධ්‍ය ද;

*ඉහළට* : ඉහළ ACP-2 කොන්ක්‍රීට් ගෙබිමේ මධ්‍ය ද;

යන මෙකී මායිම් තුළ පිහිටි වර්ගමීටර් හතයි දශම නවයයි නවයක් (ව.මී. 7.99) *නොහොත්* වර්ග අඩි අසූහයක් (ව.අ. 86) විශාල ගෙබිමය.

අංක M1P1 දරන සහාධිපත්‍ය කොටසේ සහ අංක ACP-0 දරන අනුබැඳි සහාධිපත්‍ය කොටසේ මුළු විශාලත්වය වර්ගමීටර් දෙසිය දහහතරයි දශම එකයි හතරක් (ව.මී. 214.14) *නොහොත්* වර්ග අඩි 2,305ක් වේ.

සහාධිපත්‍ය දේපළේ පොදු අංගෝපාංග තුළ එකී M1P1 දරන සහාධිපත්‍ය කොටසේ නොබෙදූ පංගුවේ වටිනාකම 3.754%ක් වේ.

එකී M1P1 දරන සහාධිපත්‍ය කොටසට ආසන්නතම පොදු ප්‍රදේශයෙන් ප්‍රවේශය CE23 වේ.

තව ද, පොදු අංගෝපාංග ද සමග ය.

තව ද, මෙහි පහත සඳහන් මාර්ග අයිතිය ද සමග ය.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ සුදුවැල්ල, අංක 24 දරන නාගරික කොට්ඨාසයේ පිහිටි පාර්ක් වීදියේ, වරිපනම් අංක 66 සහ 66A දරන, බලයලත් මිනින්දෝරු එල්. ටී. මාදොල විසින් මැන සාදන ලද අංක 2003/99 සහ 2003 අප්‍රේල් මස 20 දින දරන පිඹුරේ නිරූපිත විපී රේඛාවක් වන ලොට් "1B" වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට (බලයලත් මිනින්දෝරු ඒ. එෆ්. සමීර් විසින් මැන සාදන ලද අංක 2305 සහ 1980 මැයි මස 10 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කැබැල්ලේ නැවත මැන බෙදා වෙන් කිරීමක්වන සහ බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් මැන සාදන ලද අංක 819 සහ 2000 ජූලි මස 12 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කැබැල්ලේ නැවත මැන අනුබෙදා වෙන්කිරීමක්වන) මායිම්, උතුරට : ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත ද, නැගෙනහිරට: පාක් වීදිය ද, දකුණට : ලොට් 1A ද, බස්නාහිරට : ලොට් 1A ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2003/99 දරන පිඹුර අනුව පර්චස් බින්දුවයි දශම තුනයි හයක් (පර්. 0.36) විශාල බිම් කොටසය. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 956/228 යටතේ ලියාපදිංචි කරන ලදුව වර්තමානයේ දී D 46/113 දරන වෙළුම/පත්‍රිකාව වෙත ඉදිරියට ගෙන ගොස් ඇත.

**හතරවන උපලේඛනය (උකස් බැඳුම්කර අංක 1423)**

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Con SD 07/08, 10, 12, 14, 16, 18 යටතේ ලියාපදිංචිකර ඇත.

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමාව තුළ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජින්තුපිටිය ග්‍රාම නිලධාරී වසමේ, අංක 10 දරන නාගරික කොට්ඨාසයේ, ජිනිතුපිටිය කොටහේන, නව චෙට්ටි වීදියේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් මැන සාදන ලද අංක 4203 සහ 2017 මැයි මස 12 දින දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත, කොළඹ 12 නව චෙට්ටි වීදියේ, වරිපනම් අංක 132 M/2 දරන, මෙසනින් මහලේ අංක CPFMP2 දරන සහාධිපත්‍ය කොටස වන සාප්පුවක් වේ.

ඉහත කී CPF0P2 දරන සාප්පුවට මායිම් මෙහි පහත සඳහන් පරිදි වේ. එනම් :-

*උතුරට* : නව චෙට්ටි වීදියේ වරිපනම් අංක 140, 140/10 සහ 140/11 දරන පරිශ්‍රයන් වෙන්කරන මෙම සහාධිපත්‍ය කොටසේ බිත්තියේ මධ්‍ය ද;

*නැගෙනහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CPFMP3 අතර බිත්තියේ මධ්‍ය ද;

*දකුණට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE25 අතර බිත්තියේ මධ්‍ය ද;

*බස්නාහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CPFMP1 අතර බිත්තියේ මධ්‍ය ද;

*පහළට* : එහිම බිම් මහල ද;

*ඉහළට* : ඉහළ CPF1P1 හි කොන්ක්‍රීට් ගෙබිමේ මධ්‍ය ද;

යන මෙකී මායිම් තුළ පිහිටි වර්ගමීටර් දහසයයි දශම බින්දුවයි හතක් (ව.මී. 16.07) *නොහොත්* වර්ග අඩි එකසිය හැත්තෑතුනක් (ව.අ. 173) විශාල ගෙබිම ය.
පොදු අංගෝපාංග තුළ නොබෙදූ පංගුවේ වටිනාකම 0.040%ක් වේ.

ආසන්නතම පොදු ප්‍රදේශය CE25 වේ.

2. ඉහත කී කොළඹ 12, නව චෙට්ටි වීදියේ පිහිටි වරිපනම් අංක 132 M/3 දරන, බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් මැන සාදන ලද අංක 4203 සහ 2017 මැයි මස 12 දින දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත, මෙසනින් මහලේ අංක CPFMP3 දරන සහාධිපත්‍ය කොටස වන සාප්පුවක් වේ.

ඉහත කී CPFMP3 දරන සාප්පුවට මායිම් මෙහි පහත සඳහන් පරිදි වේ. එනම් :-

*උතුරට* : නව චෙට්ටි වීදියේ වරිපනම් අංක 140, 140/10 සහ 140/11 දරන පරිශ්‍රයන් වෙන්කරන මෙම සහාධිපත්‍ය කොටසේ බිත්තියේ මධ්‍ය ද;

*නැගෙනහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE2, CE3 සහ CE25 අතර බිත්තියේ මධ්‍ය ද;

*දකුණට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE25 අතර බිත්තියේ මධ්‍ය ද;

*බස්නාහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CPFMP2 අතර බිත්තියේ මධ්‍ය ද;

*පහළට* : එහිම බිම් මහල ද;

*ඉහළට* : ඉහළ CPF1P1 හි කොන්ක්‍රීට් ගෙබිමේ මධ්‍ය ද;

යන මෙකී මායිම් තුළ පිහිටි වර්ගමීටර් දහහතයි දශම බින්දුවයි නවයක් (ව.මී. 17.09) *නොහොත්* වර්ග අඩි එකසිය අසූහතරක් (ව.අ. 184) විශාල ගෙබිම ය.

පොදු අංගෝපාංග තුළ නොබෙදූ පංගුවේ වටිනාකම 0.042% ක් වේ.

ආසන්නතම පොදු ප්‍රදේශය CE25 වේ.

3. ඉහත කී කොළඹ 12, නව වෙට්ටි වීදියේ පිහිටි වරිපනම් අංක 132 M/4 දරන, බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් මැන සාදන ලද අංක 4203 සහ 2017 මැයි මස 12 දින දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත, මෙසනින් මහලේ අංක CPFMP4 දරන සහාධිපත්‍ය කොටසවන සාප්පුවක් වේ.

ඉහත කී CPFMP4 දරන සාප්පුවට මායිම් මෙහි පහත සඳහන් පරිදි වේ. එනම් :-

*උතුරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ ඉහළින් CPF0P1 හි විවෘත අවකාශය අතර බිත්තියේ මධ්‍ය ද;

*නැගෙනහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ ඉහළින් CPF0P1 හි විවෘත අවකාශය අතර බිත්තියේ මධ්‍ය ද;

*දකුණට* : නව වෙට්ටි වීදියේ, වරිපනම් අංක 128 දරන පරිශ්‍රය වෙන්කරන මෙම සහාධිපත්‍ය කොටසේ බිත්තියේ මධ්‍ය, මෙම සහාධිපත්‍ය කොටස සහ CE7 සහ CE8 අතර බිත්තියේ මධ්‍ය ද;

*බස්නාහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE8, CPFMP5 සහ CE24 අතර බිත්තියේ මධ්‍ය ද;

*පහළට* : එහිම බිම් මහල ද;

*ඉහළට* : ඉහළ CE17 ට ඉහළින් සහ CPF1P1 (පංගුවක්) හි කොන්ක්‍රීට් ගෙබිමේ මධ්‍ය ද;

යන මෙකී මායිම් තුළ පිහිටි වර්ගමීටර් හැත්තෑඅටයි දශම නවයයි හතක් (ව.මී. 78.97) *නොහොත්* වර්ග අඩි අටසිය පනහක් (ව.අ. 850) විශාල ගෙබිම ය.

පොදු අංගෝපාංග තුළ නොබෙදූ පංගුවේ වටිනාකම 0.195%ක් වේ.

ආසන්නතම පොදු ප්‍රදේශය CE24 වේ.

4. ඉහත කී කොළඹ 12, නව වෙට්ටි වීදියේ පිහිටි වරිපනම් අංක 132 M/5 දරන, බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් මැන සාදන ලද අංක 4203 සහ 2017 මැයි මස 12 දින දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත, මෙසනින් මහලේ අංක CPFMP5 දරන සහාධිපත්‍ය කොටස වන සාප්පුවක් වේ.

ඉහත කී CPFMP5 දරන සාප්පුවට මායිම් මෙහි පහත සඳහන් පරිදි වේ. එනම් :-

*උතුරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE24 අතර බිත්තියේ මධ්‍ය ද;

*නැගෙනහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ ඉහළින් CPFMP4 සහ CE8 අතර බිත්තියේ මධ්‍ය ද;

*දකුණට* : නව වෙට්ටි වීදියේ, වරිපනම් අංක 128 දරන පරිශ්‍රය වෙන්කරන මෙම සහාධිපත්‍ය කොටසේ බිත්තියේ මධ්‍ය ද;

*බස්නාහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CPFMP6 අතර බිත්තියේ මධ්‍ය ද;

*පහළට* : එහිම බිම් මහල ද;

*ඉහළට* : ඉහළින් CPF1P14 හි කොන්ක්‍රීට් ගෙබිමේ මධ්‍ය ද;

යන මෙකී මායිම් තුළ පිහිටි වර්ගමීටර් දහතුනයි දශම බින්දුවයි තුනයි අටක් (ව.මී. 13.038) *නොහොත්* වර්ග අඩි එකසිය හතළිස් හතරක් (ව.අ. 144) විශාල ගෙබිම ය.

පොදු අංගෝපාංග තුළ නොබෙදූ පංගුවේ වටිනාකම 0.033%ක් වේ.

ආසන්නතම පොදු ප්‍රදේශය CE24 වේ.

5. ඉහත කී කොළඹ 12, නව වෙට්ටි වීදියේ පිහිටි වරිපනම් අංක 132 M/6 දරන, බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් මැන සාදන ලද අංක 4203 සහ 2017 මැයි මස 12 දින දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත, මෙසනින් මහලේ අංක CPFMP6 දරන සහාධිපත්‍ය කොටස වන සාප්පුවක් වේ.

ඉහත කී CPFMP6 දරන සාප්පුවට මායිම් මෙහි පහත සඳහන් පරිදි වේ. එනම් :-

*උතුරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CPFMP7 සහ CE24 අතර බිත්තියේ මධ්‍ය ද;

*නැගෙනහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE24 සහ CPFMP5 අතර බිත්තියේ මධ්‍ය ද;

*දකුණට* : නව චෙට්ටි වීදියේ, වරිපනම් අංක 128 දරන පරිශ්‍රය වෙන්කරන මෙම සහාධිපත්‍ය කොටසේ බිත්තියේ මධ්‍ය, මෙම සහාධිපත්‍ය කොටස සහ CE23 අතර බිත්තියේ මධ්‍ය ද;

*බස්නාහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE17 සහ CE18 අතර බිත්තියේ මධ්‍ය ද;

*පහළට* : එහිම බිම් මහල ද;

*ඉහළට* : ඉහළින් CPF1P13 හි කොන්ක්‍රීට් ගෙබිමේ මධ්‍ය ද;

යන මෙකී මායිම් තුළ පිහිටි වර්ග මීටර් පනස්අටයි දශම එකයි හයක් (ව.මී. 58.16) *නොහොත්* වර්ග අඩි හයසිය විසිහයක් (ව.අ. 626) විශාල ගෙබිම ය.

පොදු අංගෝපාංග තුළ නොබෙදූ පංගුවේ වටිනාකම 0.144%ක් වේ.

ආසන්නතම පොදු ප්‍රදේශය CE24 වේ.

6. ඉහත කී කොළඹ 12, නව චෙට්ටි වීදියේ පිහිටි වරිපනම් අංක 132 M/7 දරන, බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් මැන සාදන ලද අංක 4203 සහ 2017 මැයි මස 12 දින දරන සහාධිපත්‍ය පිඹුරේ නිරූපිත, මෙසනින් මහලේ අංක CPFMP7 දරන සහාධිපත්‍ය කොටස වන සාප්පුවක් වේ.

ඉහත කී CPFMP7 දරන සාප්පුවට මායිම් මෙහි පහත සඳහන් පරිදි වේ. එනම් :-

*උතුරට* : නව චෙට්ටි වීදියේ, වරිපනම් අංක 140, 140/10 සහ 140/11 දරන පරිශ්‍රයන් වෙන්කරන මෙම සහාධිපත්‍ය කොටසේ බිත්තියේ මධ්‍ය, මෙම සහාධිපත්‍ය කොටස සහ CE22 අතර බිත්තියේ මධ්‍ය ද;

*නැගෙනහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE22 සහ CPFMP8 සහ CE24 අතර බිත්තියේ මධ්‍ය ද;

*දකුණට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CPFMP6 අතර බිත්තියේ මධ්‍ය ද;

*බස්නාහිරට* : මෙම සහාධිපත්‍ය කොටස සහ CE18 සහ CE17 අතර බිත්තියේ මධ්‍ය ද;

*පහළට* : එහිම බිම් මහල ද;

*ඉහළට* : ඉහළින් CPF1P12 හි කොන්ක්‍රීට් ගෙබිමේ මධ්‍ය ද;

යන මෙකී මායිම් තුළ පිහිටි වර්ග මීටර් දහහතයි දශම හයයි පහක් (ව.මී. 17.65) *නොහොත්* වර්ග අඩි එකසිය අනූවක් (ව.අ. 190) විශාල ගෙබිම ය.

පොදු අංගෝපාංග තුළ නොබෙදූ පංගුවේ වටිනාකම 0.044%ක් වේ.

ආසන්නතම පොදු ප්‍රදේශය CE24 වේ.

තව ද, ව්‍යවස්ථාපිත පොදු අංගෝපාංග ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නිමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

08-24

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - ගාල්ල නගර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 2089749

(නැසී ගිය කතලුව ලියනගේ බන්දුල *හෙවත්* බන්දුල කතලුව ලියනගේගේ යන අයගේ දේපළ අද්මිනිස්ත්‍රාසි කිරීම සඳහා අද්මිනිස්ත්‍රාසි බලකාරිය ලෙස ගාල්ල දිසා අධිකරණයේ T/543 අංක දරන නඩුවෙන් පත් කරන ලද ගෝවින්ද රත්නායක වාසල මුදියන්සේලාගේ නාමලි මැණිකේ වීරකෝන්)

**O/A - ග්‍රෑන්ඩ් ගාමන්ට්ස්**

2024 ජනවාරි 30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. විජේනාරායන විසින් 2011 ජූලි 01 වැනි දින සහතික කරන ලද උකස් බැඳුම්කර අංක 3688, ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එල්. ද සිල්වා විසින් 2015 අගෝස්තු 21 වැනි දින සහතික කරන ලද උකස් බැඳුම්කර අංක 033 සහ 2015 අගෝස්තු 21 වැනි දින සහතික කරන ලද අතිරේක උකස් බැඳුම්කර අංක 034 දරන උකස් බැඳුම්කරයන් මගින්, වෙනත් කරුණු අතර, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම් හා පරිශ්‍රයන් උකස් කොට බැඳ දමා ඇති "ග්‍රෑන්ඩ් ගාමන්ට්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ තනි අයිතිකරුවෙක් ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යන ගාල්ල, වක්වැල්ල, "ගාමිණී විලා" හි කතලුව ලියනගේ බන්දුල *හෙවත්* බන්දුල කතලුව ලියනගේ (දැන් නැසීගිය) ණයකරු හැටියට සහ ඉහත කී පහසුකම නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද එකී උකස් බැඳුම්කර අංක 3688, 033 සහ අතිරේක උකස් බැඳුම්කර අංක 034 මත අයවිය යුතු මුදල් ගෙවීම එකී නැසී ගිය කතලුව ලියනගේ බන්දුල *හෙවත්* බන්දුල කතලුව ලියනගේ සහ/හෝ ගෝවින්ද රත්නායක වාසල මුදියන්සේලාගේ නාමලි මැණිකේ වීරකෝන් ඉහත කී අද්මිනිස්ත්‍රාසි බලකාරිය පැහැර හැර ඇති හෙයින්,

සහ එකී බැඳුම්කරයන් යටතේ එකී ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2089749 සම්බන්ධයෙන් වෙනත් කරුණු අතර, එක්සත් ජනපද ඩොලර් හය ලක්ෂ නව දහස් පනස් හතරයි ශත විසි තුනක (එක්සත් ජනපද ඩොලර් 609,054.23) මුළු මුදලක් හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් මුදල 2023 නොවැම්බර් 17 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී එක්සත් ජනපද ඩොලර් හය ලක්ෂ නව දහස් පනස් හතරයි ශත විසි තුනක (එක්සත් ජනපද ඩොලර් 609,054.23) මුදල හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල්වලින් මුදල අයකර ගැනීම සඳහා සහ 2023 නොවැම්බර් 18 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට එකී ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2089749 මත, එක්සත් ජනපද ඩොලර් 373,158.90ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට එක්සත් ජනපද ඩොලර් LIBOR අගය + 6.00% බැගින් (2023.11.17 දින වන විට වර්ෂයකට 11.5167 බැගින්) වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී උකස් බැඳුම්කර අංක 3688, 33 සහ අතිරේක උකස් බැඳුම්කර අංක 34 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද ඉඩම් හා පරිශ්‍රයන් මහරගම, කටුවාවල පාරේ, අංක 30/83 දරන ස්ථානයේ සහ එසේම කොළඹ 08, බොරැල්ල, සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්, 1 වන මහලේ, අංක 7/1/10 දරන ස්ථානයේ "ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන, බලයලත් වෙන්දේසිකරුවන් වන, ලොකු බණ්ඩා සේනානායක, මගුරු දෙනියේ වලව්වේ ත්‍රිවංක වරිත් සේනානායක සහ ගුරුගේ සුමනාවතී සේනානායක යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, පැලවත්ත අංක 123B දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත බොපේ, පොද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ල කඩවත් සතර ඇතුළත සහ බෝපේ, පෝද්දල ප්‍රාදේශීය සභා සීමා ඇතුළත වටරුක (දැන් හපුගල) පිහිටි කොහොඹන්වත්ත (කොටස) සහ වත්ත අද්දරකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඒ. ලොකුනාරංගොඩ විසින් 2004.11.07 වැනි දින පිළියෙළ කරන ලද අංක 174 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් B වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු එන්. ජී. ඊ. ඩයස් විසින් 1984.09.30 වැනි දින පිළියෙළ කරන ලද අංක 2947 දරන පිඹුරේ දැක්වෙන ලොට් B හි නැවත මැනීමක් වන) මායිම් වශයෙන්, උතුරට : ලොට් A මගින් ද, නැගෙනහිරට : ගාල්ල සිට වක්වැල්ල දක්වා ප්‍රධාන පාර මගින් ද, දකුණට : ලොට් C මගින් ද සහ බස්නාහිරට : අන්දහන් දොළ මගින් ද මායිම් වූ එකී අංක 174 දරන පිඹුර ප්‍රකාරව රූඩ් දෙකයි පර්චස් පහයි දශම පහක (රූ.2, පර්. 5.5) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව R 70/130 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී වටරුක (දැන් හපුගල) පිහිටි කොහොඹන්වත්ත (කොටස) සහ වත්ත අද්දරකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඒ. ලොකුනාරංගොඩ විසින් 2004.11.07 වැනි දින පිළියෙළ කරන ලද අංක 174 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් C වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු එන්. ජී. ඊ. ඩයස් විසින් 1984.09.30 වැනි දින පිළියෙළ කරන ලද අංක 2947 දරන පිඹුරේ දැක්වෙන ලොට් C හි නැවත මැනීමක් වන) මායිම් වශයෙන්, උතුරට : ලොට් B මගින් ද, නැගෙනහිරට : ගාල්ල සිට වක්වැල්ල දක්වා ප්‍රධාන පාර මගින් ද, දකුණට : එම ඉඩමේ කොටස මගින් ද සහ බස්නාහිරට : අන්දහන් දොළ මගින් ද මායිම් වූ එකී අංක 174 දරන පිඹුර ප්‍රකාරව අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විසි අටයි දශම හතරයි හතක (අ.1, රූ.3, පර්. 28.47) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව R 70/131 යටතේ ලියාපදිංචි කර ඇත.

2024 ජනවාරි මස 30 වැනි දින.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

08-13

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - ගාල්ල නගර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : අයිරාව (1270006029)

(නැසී ගිය කතලුව ලියනගේ බන්දුල *හෙවත්* බන්දුල කතලුව ලියනගේ යන අයගේ දේපළ අද්මිනිස්ත්‍රාසි කිරීම සඳහා අද්මිනිස්ත්‍රාසි බලකාරිය ලෙස ගාල්ල දිසා අධිකරණයේ T/543 අංක දරන නඩුවෙන් පත් කරන ලද ගෝවින්ද රත්නායක වාසල මුදියන්සේලාගේ නාමලි මැණිකේ වීරකෝන්)

**O/A - ශ්‍රැන්ඩ් ගාමන්ට්ස්**

2024 ජනවාරි 30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එල්. ද සිල්වා විසින් 2015 නොවැම්බර් 12 වැනි දින සහතික කරන ලද අංක 87 සහ 2016 දෙසැම්බර් 09 වැනි දින සහතික කරන ලද අංක 272 දරන උකස් බැඳුම්කරයන් මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම හා පරිශ්‍රය උකස් කොට බැඳ දමා ඇති "ශ්‍රැන්ඩ් ගාමන්ට්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ තනි අයිතිකරුවෙක් ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යන ගාල්ල, වක්වැල්ල, "ගාමිණී විලා" හි කතලුව ලියනගේ බන්දුල *හෙවත්* බන්දුල කතලුව ලියනගේ (දැන් නැසීගිය) ණයකරු හැටියට සහ ඉහත කී පහසුකම නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද එකී බැඳුම්කර අංක 87 සහ 272 මත අයවිය යුතු මුදල් ගෙවීම එකී නැසී ගිය කතලුව ලියනගේ බන්දුල *හෙවත්* බන්දුල කතලුව ලියනගේ සහ/හෝ ගෝවින්ද රත්නායක වාසල මුදියන්සේලාගේ නාමලි මැණිකේ වීරකෝන් ඉහත කී අද්මිනිස්ත්‍රාසි බලකාරිය පැහැර හැර ඇති හෙයින්,

සහ එකී බැඳුම්කරයන් යටතේ (ජංගම ගිණුම් අංක 1270006029 මත අයිරා පහසුකම වශයෙන් දිය යුතු කොටස සම්බන්ධයෙන්) වෙනත් කරුණු අතර, රුපියල් මිලියන විසි හතක (රු. 27,000,000.00)ක මුදලක්, 2023 නොවැම්බර් 17 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන විසි හතක (රු. 27,000,000.00) මුදල අයකර ගැනීම සඳහා සහ 2023 නොවැම්බර් 18 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට එකී රු. 27,000,000.00ක මුදල මත වර්ෂයකට 29% බැගින් වැඩිදුර පොලිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 87 සහ 272 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද ඉඩම හා පරිශ්‍රය මහරගම, කටුවාවල පාරේ, අංක 30/83 දරන ස්ථානයේ සහ එසේම කොළඹ 08, බොරැල්ල, සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්, 1 වන මහලේ, අංක 7/1/10 දරන ස්ථානයේ "ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන, බලයලත් වෙන්දේසිකරුවන් වන, ලොකු බණ්ඩා සේනානායක, මගුරු දෙනියේ වලව්වේ ත්‍රිවංක වරිත් සේනානායක සහ ගුරුගේ සුමනාවතී සේනානායක යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

**උපලේඛනය**

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, පැලවත්ත අංක 123B දරන ග්‍රාම නිළධාරි කොට්ඨාසය ඇතුළත බෝපේ, පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ල කඩවත් සතර ඇතුළත සහ බෝපේ, පෝද්දල ප්‍රාදේශීය සභා සීමා ඇතුළත වටරැක (දැන් හපුගල) පිහිටි කොහොබන්වත්ත (කොටස) සහ වත්ත අද්දරකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඒ. ලොකුනාරංගොඩ විසින් 2004.11.07 වැනි දින පිළියෙළ කරන ලද අංක 174 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් B වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු එන්. ජී. ඊ. ඩයස් විසින් 1984.09.30 වැනි දින පිළියෙළ කරන ලද අංක 2947 දරන පිඹුරේ දැක්වෙන ලොට් B හි නැවත මැනීමක් වන) මායිම් වශයෙන්, උතුරට: ලොට් A මගින් ද, නැගෙනහිරට : ගාල්ල සිට වක්වැල්ල දක්වා ප්‍රධාන පාර මගින් ද, දකුණට : ලොට් C මගින් ද සහ බස්නාහිරට: අන්දහන් දොළ මගින් ද මායිම් වූ එකී අංක 174 දරන පිඹුර ප්‍රකාරව රූඩ් දෙකයි පර්චස් පහයි දශම පහක (රූ.2, පර්. 5.5) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව R 70/130 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී වටරැක (දැන් හපුගල) පිහිටි කොහොබන්වත්ත (කොටස) සහ වත්ත අද්දරකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඒ. ලොකුනාරංගොඩ විසින් 2004.11.07 වැනි දින පිළියෙළ කරන ලද අංක 174 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් C වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු එන්. ජී. ඊ. ඩයස් විසින් 1984.09.30

වැනි දින පිළියෙළ කරන ලද අංක 2947 දරන පිඹුරේ දැක්වෙන ලොට් C හි නැවත මැනීමක් වන) මායිම් වශයෙන්, උතුරට : ලොට් B මගින් ද, නැගෙනහිරට : ගාල්ල සිට වක්වැල්ල දක්වා ප්‍රධාන පාර මගින් ද, දකුණට : එම ඉඩමේ කොටස මගින් ද සහ බස්නාහිරට : අන්දහන් දොළ මගින් ද මායිම් වූ එකී අංක 174 දරන පිඹුර ප්‍රකාරව අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විසි අටයි දශම හතරයි හතක (අ.1, රූ.3, පර්. 28.47) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් වන මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිකාව R 70/131 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2024 ජනවාරි මස 30 වැනි දින.

08-12

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2025 වර්ෂය** | | | |
| **අගෝස්තු** | 2025.08.01 | සිකුරාදා | 2025.07.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.08.07 | බ්‍රහස්පතින්දා | 2025.07.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.08.15 | සිකුරාදා | 2025.08.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.08.22 | සිකුරාදා | 2025.08.07 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2025.08.29 | සිකුරාදා | 2025.08.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2025.09.04 | බ්‍රහස්පතින්දා | 2025.08.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.09.12 | සිකුරාදා | 2025.08.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.09.19 | සිකුරාදා | 2025.09.04 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2025.09.26 | සිකුරාදා | 2025.09.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2025.10.03 | සිකුරාදා | 2025.09.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.10 | සිකුරාදා | 2025.09.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.17 | සිකුරාදා | 2025.10.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.24 | සිකුරාදා | 2025.10.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.31 | සිකුරාදා | 2025.10.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.